සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

22 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020


**Second Term Test - Grade 12 - 2020**

භූගෝල විද්‍යාව II — කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස (භෞතික භූගෝල විද්‍යාව)

01). පෘථිවියේ ගුරුත්වාකර්ෂණ ශක්තිය මඟින් පෘථිවි තලය හා බැඳී පවතින, විනිවිද පෙනෙන නිර්ගන්ධ වායු ආවරණය වායුගෝලය ලෙස හැඳින්වේ.




i. වායුගෝලයේ ස්තරායනය දැක්වෙන මෙම රූප සටහනෙ හි,

a). ඉහළට යන විට උෂ්ණත්වය ක්‍රමයෙන් වැඩිවන ස්තර දෙකෙහි අක්ෂර දෙක දක්වා නිවැරදි ව නම් කරන්න. (ල.2)


b). උෂ්ණත්වය අඩු ම ස්තරය නම් කරන්න. (ල.1)

ii. වායුගෝලය දූෂණයට ලක්වීම නිසා ඇතිවිය හැකි බලපෑම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

iii. පෘථිවි කබොල ආශ්‍රිත ව සිදුකරන මානව ක්‍රියාකාරකම් නිසා ඇතිවන අහිතකර බලපෑම් තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

iv. වනාන්තර විනාශවීම ජෛවගෝලයේ පැවැත්මට හා ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.6)

02). පෘථිවි පෘෂ්ඨයෙන් බාහිර ව ක්‍රියාත්මක වන බලවේග බහිර්ජන්‍ය බලවේග නම් වේ.





i. රූප සටහනෙහි දැක්වෙන ගංගාවක ආරම්භයේ සිට අවසානය දක්වා වන දික් හා හරස් පැතිකඩවල A, B, C ලෙස දක්වා ඇති අවස්ථාවන් නම් කරන්න. (ල.3)

ii. ඉහත එක් එක් අවස්ථාවේ ගංගාවේ ක්‍රියාකාරිත්වය කෙටියෙන් පැහැදිලි කරන්න (ල.6)

iii. ගංගාවක භාරය පරිවහනය සිදුකරන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.5)

iv. ගංගා ආශ්‍රිත භූ රූප නිර්මාණ ක්‍රියාවලියේ දී නිධිසාදනය ආශ්‍රිත ව නිර්මාණය වන භූ රූප තුනක් රූප සටහන් සහිත ව විස්තර කරන්න. (ල.6)

03). වසර මිලියන 4600 කට පමණ පෙර උපත ලදැයි විශ්වාස කරන පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ගෝලාකාර ස්තර කිහිපයකින් සමන්විත වේ.




i. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය දැක්වෙන මෙම රූප සටහනෙහි
   a). අංක ④ හා ⑥ න් දැක්වෙන ස්තර දෙක
   b). B හා C ලෙස නම් කර ඇති අසන්තතීන් දෙක නිවැරදි ව නම් කරන්න. (ල.4)

ii. a). අංක ①, ② හා ③ න් දැක්වෙන ස්තර එක්ව ගත් කළ හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද? (ල.1)
   b). අංක ① හා ② කලාප දෙකෙහි ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල.3)


iii. උපත අනුව වර්ග කර දක්වා ඇති අවසාදිත පාෂාණ වර්ගීකරණයෙහි හිස්තැන් වරහන් තුළ දී ඇති තොරතුරු උපයෝගී කරගෙන සම්පූර්ණ කරන්න. (ල.6)

| | | |
|---|---|---|
| **ඛණ්ඩජ අවසාදිත** | **A** | බොරළු, අකුරු මැටි, බ්‍රෙෂියා |
| | වාලුකාමය | **B** |
| **රසායනික වශයෙන් අවක්ෂේප වූ අවසාදිත** | **C** | ලුණු, ලවණ පාෂාණ |
| | යගල් | **D** |
| **E** | අංගාරමය | **F** |

(හෙමටයිට්, ජිප්සම්, ගල් අඟුරු, ක්ලෝරයිඩ්, මඩ, අෂ්ටිලමය, ජෛන්ද්‍රීය අවසාදිත, වැලිගල්)

iv. a). ශ්‍රී ලංකාවේ ඇති බලශක්තිමය ඛනිජ වර්ග දෙකක් හා ඒවා දක්නට ලැබෙන ප්‍රදේශය බැගින් දක්වන්න. (ල.2)
   b). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අලෝහමය ඛනිජ වර්ග හතරක් නම් කර, ඉන් එක් ඛනිජ වර්ගයක ඇති ආර්ථිකමය වටිනාකම පැහැදිලි කරන්න. (ල.4)

04). ජලය, ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි.




i. ජලගෝලය යන්න හඳුන්වන්න. (ල.2)


ii. ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය සරල ව දැක්වෙන මෙම රූප සටහනෙහි A, B, C හා D ලෙස නම් කර ඇති ක්‍රියාවලීන් නම් කර කෙටියෙන් හඳුන්වන්න.(ල.6)

iii. ජල චක්‍රයේ ක්‍රියාවලීන් පාරිසරික සංසිද්ධි කෙරෙහි බලපාන ආකාර දෙකක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ල.6)

iv. ජලයේ ගුණාත්මකභාවය වෙනස්වීම හෙවත් ජල දූෂණය කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.6)

# II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05). රටක වටිනාම සම්පත එරට ජන සංඛ්‍යාවයි.




i. මෙම ප්‍රස්තාරයට අනුව 1995 සිට 2035 දක්වා වයස අවු. 15-24 කාණ්ඩය තරුණ ජනසංඛ්‍යාව හා වයස අවු. 65ට වැඩි වයස්ගත ජනසංඛ්‍යා කාණ්ඩය සසඳන විට පැහැදිලි වන ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න. (ල.2)

ii. වයස අවු. 15-24 වයස් කාණ්ඩය සඳහා සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයේ දී සලකා බැලිය යුතු ප්‍රධාන ගැටළු තුනක් සාකච්ඡා කරන්න. (ල.6)


iii. වර්තමාන ලෝකයේ බොහෝ රටවල වයස්ගත ජනසංඛ්‍යා කාණ්ඩය ඉහළ යාමට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල.6)

iv. ආසියානු රටවල සමාජ ආර්ථික සංවරධනයේ දී වයස්ගත ජන කණ්ඩායම කෙරෙහි සලකා බැලිය යුතු ගැටළු හතරක් විස්තර කරන්න. (ල.6)


06). “ජනාවාස යනු පොළෝතලයේ මිනිසා විසින් ගොඩනගන ලද වාසභූමියකි” - ඩිකින්සන්

i. පහත රූප සටහන් හි දැක්වෙන්නේ ලෝකයේ හඳුනාගත හැකි ප්‍රධාන ජනාවාස රටා දෙකකි. එම ජනාවාස වර්ග දෙක නිවැරදි ව නම් කරන්න. (ල.2)

A



B




ii. A රූප සටහනෙහි දැක්වෙන ජනාවාස රටා හඳුනාගත හැකි ප්‍රදේශ සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල.6)

iii. a). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන ජනාවාස වර්ග තුන නම් කරන්න. (ල.3)

b). ඉන් එක් ජනාවාස වර්ගයක දැකිය හැකි ලක්ෂණ පැහැදිලි කරන්න. (ල.3)

iv. ජනාවාස බිහිවීම කෙරෙහි බලපාන භෞතික හා මානුෂ සාධක තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.6)

07). කාර්මික විප්ලවය හා සමගාමී ව වර්ධනය වූ නාගරීකරණය විශාල වශයෙන් ලෝකය පුරා සමාජ ආර්ථික විපර්යාසවලට තුඩු දී ඇති සාධකයකි.




i. 2014 වර්ෂයේ දී ලොව අවම නාගරීකරණයක් පැවැති රටවල් කිහිපයක් පහත සිතියමේ දැක්වේ. එහි A, B, C, D ලෙස නම් කර ඇති රටවල් නිවැරදි ව නම් කරන්න. (ල.2)

ii. වර්තමානයේ දේශසීමා අබිබවා ඉන් බැහැරට ව්‍යාප්ත වී ඇති **<u>නව නාගරික කලාප</u>** හඳුන්වන නම් හා එම කලාපවල ව්‍යාප්ති ප්‍රදේශ නම් කරන්න. (ල.6)

iii. නාගරික ප්‍රදේශවලින් ආරම්භ වී අනෙකුත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වන අංශ තුනක් පැහැදිලි කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ව නිර්මාණය වී ඇති ගැටළු විසඳීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල.6)

08). "මිනිසාගේ සාමාන්‍ය පදිංචි ස්ථානයේ වෙනසක් ඇති කරවන පැහැදිලි අන්තර්-භූගෝලීය ඒකක අතර සිදුවන සංචලතාව සංක්‍රමණයකි" - එක්සත් ජාතීන්ගේ සංවිධානය

i. ජාත්‍යන්තර සංක්‍රමණවල ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල.4)

ii. සංක්‍රමණ නිසා සංවර්ධිත රටවලට මුහුණ පෑමට සිදු වී ඇති ගැටළු දෙකක් සාකච්ඡා කරන්න. (ල.4)

iii. ජාත්‍යන්තර සංක්‍රමණවලට පෙළඹවීම් ඇතිකරන සාධක විස්තර කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණවල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ල.6)